# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2422/51 - 2025 පෙබරවාරි මස 07 වැනි සිකුරාදා - 2025.02.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : AMB/LD/1/AQ/100 (ii).
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/5/2017/HA/116.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවයේ විස්තර* :-

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 75, බටපොළ බටහිර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙළ කර ඇති කැඩැස්තර සිතියම් අංක 810529 හා 2024.12.30 දිනැති මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0192 ක් වූ පහත සඳහන් පරිදි සවිස්තරව පෙන්නුම් කෙරෙන ඉඩම් කැබලි තුන (03) :

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: ඉළුක්පිටියවත්ත *හෙවත්* වෙලබඩවත්ත; විස්තරය : ගෙවත්ත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය : ආර්. කේ. දයාවති, ඉළුක්පිටිය, බටපොළ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0042. (පර්චස් 1.7)

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: ඉළුක්පිටියවත්ත *හෙවත්* වෙලබඩවත්ත; විස්තරය : ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය : සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0128. (පර්චස් 5.1)

03. **කැබලි අංක 03**
ඉඩමේ නම: ඉළුක්පිටියවත්ත *හෙවත්* වෙලබඩවත්ත; විස්තරය : ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය : සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0022. (පර්චස් 0.9)

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 මාර්තු මස 21 වැනි දින පෙ.ව. 09.30 ට අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2025 මාර්තු මස 14 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

එම්. ජී. හසන්ති නිරෝෂනී,
ප්‍රාදේශීය ලේකම්,
අම්බලන්ගොඩ.

2025 පෙබරවාරි මස 03 වැනි දින,
අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 02 - 0075